සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## සංගීතය (සිංහල)

**නම/විභාග අංකය :-** ......................................................................... **කාලය : පැය 02යි.**

**i කොටස**

♦ **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකි.

   1. ගිටාරය 2. වයලීනය 3. සර්පිනාව 4. සිතාරය

2. 'සුවඳ පද්ම ඕලු ආදී....' ගීතය අයත් වන නූර්ති නාට්‍ය වනුයේ,

   1. විදුර 2. වෙස්සන්තර 3. රාමායනය 4. දුටුගැමුණු

3. සරිග, රිගම, ...... යන ස්වර රටාවට ගැලපෙන ඊළඟ ස්වර රටාව තෝරන්න.

   1. පධනි 2. ගමප 3. මපධ 4. ධනිස

4. ස්වර සප්තකයේ පස්වන ස්වරය,

   1. මධ්‍යමයයි 2. රිෂභයයි 3. පංචමයයි 4. නිෂාදයයි

5. සසරිරි/ගම/සරිගම/පධප මින් කියවෙන ස්වර ස්ථාපන ගීතය වන්නේ,

   1. මුණිසිරිපාදේ 2. බැතින සිරිපා 3. කඳුපෙළ අතරේ 4. ආෘත ඇදී යලි


♦ **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා වගන්ති හරි නම් හරි ලකුණ (√) ද වැරදි නම් වැරදි ලකුණ (X) ද වරහන් තුළ යොදන්න.**

6. නිවැරදි ස්වර ගායනය සඳහා සවන් දීම ඉතා වැදගත් වේ. ( )
7. පෙරදිග සංගීතය පැවති ප්‍රධානතම රට ශ්‍රී ලංකාවයි. ( )
8. පාසලක අනන්‍යතාවය, අභිමානය පාසල් ගීයෙන් කියැවේ. ( )
9. එළුවන් කැම සත්ත්ව චරිත දෙකක් ඇතුළත් ජන ක්‍රීඩාවකි. ( )
10. ජාතික ගීය ගායනා කිරීමේ දී තමාට පහසු ඉරියව්වකින් සිටිය යුතු ය. ( )

♦ A **කොටසට ගැළපෙන පිළිතුර** B **කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | ශුද්ධ ස්ථාපන ගීතයකි | ඇහැළ මලින් ගස් පිරිලා |
| 12. | කෙළි ගීතයකි | අද වෙස්සන්තර රාජ පුතා |
| 13. | ළමා ගීතයකි | ජලේ හොඳයි බැසලා පීනන්නට |
| 14. | නූර්ති ගීතයකි | බැතින සිරිපා කරුණා කරනා |
| 15. | නාට්‍ය ගීතයකි | සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන |

♦ **මෙහි දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**




**හරහට**

16. නූර්ති සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය මෙය වේ.

19. ගැමියන්ගේ ජන ක්‍රීඩා අතර දක්නට ලැබෙන ජන නැටුමකි.

20. ප්‍රධාන තත් හතකින් යුත් මෙම භාණ්ඩය වාදනය සඳහා මිස්රාබ් නම් උපකරණයක් භාවිත කරයි.

**පහළට**

17. හින්දුස්ථානි රාගධාරී සංගීතයේ ආභාෂය ලද ගීත විශේෂයකි.

18. පෙරදිග අපරදිග සම්ප්‍රදායන් දෙකෙහිම භාවිත වන සංගීත භාණ්ඩයකි.

## II කොටස


♦ **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. i. සංගීතයේ භාවිත වන ශුද්ධ ස්වර හත පිළිවෙලින් ලියන්න. (ලකුණු 1)
    ii. එම ස්වර සඳහා පෙරදිග ස්වර නාම හා අපරදිග ස්වර සංකේත ලියන්න. (ලකුණු 7)
    iii. පහත සඳහන් ස්වර ස්ථාපන ගීත අතරින් එක් ගීතයක් තෝරා ගෙන එම ගීතය ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.
    a) එකට සතුටු සාගරේ.....
    b) කඳු පෙළ අතරේ....
    c) බැතින සිරිපා.... (ලකුණු 4)

2. i. ඔබ දන්නා නූර්ති නාට්‍ය දෙකක නම් ලියන්න. (ලකුණු 2)
   ii. නූර්ති නාට්‍ය පිළිබඳව ඔබ ඉගෙනගත් කරුණු තුනක් ලියන්න. (ලකුණු 3)
   iii. නූර්ති ගීතයක පද මාලාව සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 7)

3. i. ළමා ගීත රචනා කර ඇති රචකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
   ii. ළමා ගීතයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)
   iii. ඔබ දන්නා ළමා ගීතයක පද මාලාව සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 6)

4. i. පහත සඳහන් සංගීත භාණ්ඩ රවුම තුළ අදාළ ස්ථානයන්හි ලියන්න.
බට නලාව, සිතාරය, වයලීනය, ගිටාරය, තබ්ලාව, මවුත් ඕගන්, පියානෝව, විද්‍යුත් ස්වර පුවරුව




ii. ඉහත සඳහන් සංගීත භාණ්ඩ අතුරින් ඔබ කැමති භාණ්ඩ දෙකක් නම් කර එම භාණ්ඩවලට අදාළව කරුණු දෙක බැගින් ලියන්න. (ලකුණු 4)

5. i. පහත සඳහන් තාලානුකූල ස්වර අභ්‍යාසයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| | | | |
|---|---|---|---|
| ස ස රි | රි රි ග | ______ | ප |
| ප ම ප | ______ | ග රි ග | ස |
| ස රි ග ම | ______ | ග ම ප ධ | ස |
| ______ | නි ධ ප ම | ______ | ස |

(එක් හිස්තැනකට ලකුණු දෙක බැගින් 5 සඳහා ලකුණු 10)

ii. ඔබ දන්නා ස්වර අභ්‍යාසයක් තාලානුකූලව ආරෝහණ/අවරෝහණ ලෙස ගොඩනගන්න (ලකුණු 2)

6. තාsන තනාs/ තම්දෙ /නාsතම් දනාs/ නා sssss

i. ඉහත තානම අයත් කෙළි ගී වර්ගය නම් කරන්න. (ලකුණු 2)

ii. එම කෙලි ගී වර්ගයට අයත් කවියක් ලියන්න. (ලකුණු 4)

iii. ඔබ විසින් ලියන ලද කවිය ගායනයේ දී වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩ දෙකක් ලියන්න. (ලකුණු 2)

iv. දේශීය ජන ක්‍රීඩා තුළින් ගැමි සමාජයේ දරුවන්ට ලැබුණු යහපත් ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 4)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## සංගීතය (සිංහල) - ප්‍රායෝගික පරීක්ෂණය

---

01. ඔබ කැමති ස්වර ස්ථාපන ගීතයක් ගායනා කරන්න.

| ලකුණු නිර්ණායක | ලකුණු | |
|---|---|---|
| ශ්‍රැතිය | 2 | |
| නාද මාලාව | 4 | |
| තාලය | 2 | |
| මිහිරි බව | 2 | (මුළු ලකුණු 10) |

02. ඔබ ඉගෙන ගත් ළමා ගීතයක් හෝ නූර්ති ගීතයක් ගායනා කරන්න.

| ලකුණු නිර්ණායක | ලකුණු | |
|---|---|---|
| ශ්‍රැතිය | 2 | |
| නාද මාලාව | 2 | |
| තාලය | 2 | |
| මිහිරි බව | 2 | |
| ප්‍රසංගාත්මක | 2 | (මුළු ලකුණු 10) |

03. ගුරුවරයා විසින් නම් කරන කෙළි ගීතයක් ගායනා කරන්න.

| ලකුණු නිර්ණායක | ලකුණු | |
|---|---|---|
| ශ්‍රැතිය | 2 | |
| නාද මාලාව | 4 | |
| නිවැරදි වචන උච්චාරණය | 2 | |
| තාලානුකූල බව | 2 | (මුළු ලකුණු 10) |

04. තෝරාගත් වාද්‍ය භාණ්ඩය වාදනය

| | | |
|---|---|---|
| නිවැරදි ඉරියව් භාවිතය | 2 | |
| ස්වර ස්ථාන සඳහා නිවැරදි ඇඟිලි හැසිරවීම | 2 | |
| ස රි ග ම ස්වර වාදනය | 4 | |
| සමස්ත ඉදිරිපත් කිරීම | 2 | (මුළු ලකුණු 10) |

05. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් ආරෝහණ/අවරෝහණ වාදනය හෝ තාලානුකූල ස්වර අභ්‍යාසයක් වාදනය

| නිර්ණායක | ලකුණු | |
|---|---|---|
| නිවැරදි ඇඟිලි හැසිරවීම | 4 | |
| තාලය | 4 | |
| මිහිරි බව | 2 | (මුළු ලකුණු 10) |

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## සංගීතය (සිංහල) - පිළිතුරු පත්‍රය

---

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. 3 | 02. 4 | 03. 2 | 04. 3 | 05. 1 |
| 06. √ | 07. X | 08. √ | 09. √ | 10. X |

11. බැතිනා සිරිපා කරුණා කරනා
12. ජලේ හොඳයි බැසලා පීනන්නට
13. සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන
14. අද වෙස්සන්තර
15. ඇහැළ මලින් ගස් පිරිලා
16. සර්පිනාව
17. නූර්ති
18. වයලීනය
19. කෙළි ගී
20. සිතාරය

---

### II කොටස

01. i. ස රි ග ම ප ධ නි (ලකුණු 1)
  ii. සඩ්ජය, රිෂභය, ගාන්ධාරය, මධ්‍යමය, පංචමය, ධෛවතය, නිෂාදය
  Do, Re, Mi, Fa, So, La, Ti (ලකුණු 7)
  iii. නිවැරදි ගීත ස්වර ප්‍රස්ථාරයට (ලකුණු 4)

2. i. දුටුගැමුණු , විදුර, වෙස්සන්තර ආදී ඕනෑම නූර්ති නාට්‍ය දෙකකට (ලකුණු 2)
  ii. ලියන ලද කරුණු අනුව (ලකුණු 3)
  iii. නූර්ති ගීතයේ නිවැරදි පද මාලාවට (ලකුණු 7)

3. i. එස්. මහින්ද හිමි, කුමාරතුංග මුනිදාස, අරිසෙන් අහුබුදු (ලකුණු 2)
  ii. භාෂාව සරල වීම, සරල රිද්ම රටාවක් තිබීම, ළමයින්ට සුදුසු තේමාවලින් යුක්ත වීම, තනුවේ සරල බව හා රසවත් බව
  (කරුණු දෙකක් සඳහා) (ලකුණු 4)
  iii. ගීතයේ නිවැරදි බවට (ලකුණු 6)

4. i. සංගීත භාණ්ඩ අදාළ ස්ථානයන්හි ලිවීමට (ලකුණු 8)
  ii. නිවැරදි පිළිතුරු සඳහා (ලකුණු 4)

5. i. හිස්තැන් පිරවීමට
  ස සරි / රි රිග / ග ගම / ප /
  ප මප / ම ගම / ග රිග / ස /
  සරිගම / රිගමප / ගමපධ / සි /
  ස්‌නිධප / නිධපම / ධපමග / ස /

  ii. නිවැරදි ස්වර අභ්‍යාසයට (ලකුණු 4)

6. i. කළගෙඩි සෙල්ලම (ලකුණු 2)
  ii. කළගෙඩි සෙල්ලමට අයත් ඕනෑම කවියක් (ලකුණු 4)
  iii. සුදුසු වාද්‍ය භාණ්ඩ සඳහා (ලකුණු 2)
  iv. එකමුතුකම, සුහදතාවය, සාමූහිකත්වය (ලකුණු 4)

(මුළු ලකුණු 12 X 5 = 60)